# <u>බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව</u>

| | | |
|---|---|---|
| දිනය | : | 2023.08.18 |
| වේලාව | : | ප.ව. 12.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| **මූලාසනය** | : | **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)** |

**<u>සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය</u>**

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 07) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 08) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 09) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 10) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 11) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 12) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 13) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.08.18 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාවයි.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන 1810 ක් අතරින් ආයතන 1492 ක් කාර්ය සාධන තරඟාවලිය සඳහා ලියාපදිංචි වී තිබූ බවත්,මෙම ආයතන පළමු වටය විනිශ්‍යවය කිරීමෙන් අනතුරුව දෙවන වටය සඳහා ආයතන 386 ක් සුදුසුකම් ලබා ඇති බවත්, පළමු වටය සඳහා ආයතන විනිශ්චය කිරීම සඳහා සකස් කරන ලද නිර්නායක 262 සාරාංශ ගතකර ප්‍රධාන අංශ 7 ක් යටතේ ඉදිරි වටයේ ආයතන විනිශ්චය කිරීමට බලාපොරොත්තු වන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන ) විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද පළාත් සභා ආයතන ඇගයීම් කිරීමේදී ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ එනම් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත යන කාණ්ඩ යටතේ විනිශ්චය කිරීමට බලාපොරොත්තු වන අතර එම ප්‍රධාන කාණ්ඩ යටතේ තෝරාගත් ආයතන විනිශ්චය කිරීමට දිස්ත්‍රික් හා ප්‍රාදේශිය පරිපාලයෙන් තෝරාගත් නිලධාරීන්ගෙන් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මඟින් විනිශ්චය කිරීමට කටයුතු කරන බවත් , අනිකුත් ආයතන පළාත් සභා නිලධාරීන් විසින් විනිශ්චය කරවීමට බලාපොරොත්තු වන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br>කාර්ය සාධන තරඟාවලිය සඳහා ලියාපදිංචි නොවූ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන සඳහා පැවැත්වෙන තරඟාවලිය සම්බන්ධව සාකච්ඡා කළ අතර එම ආයතන සම්බන්ධව වාර්තාවක් ප්‍රධාන ලේකම් හරහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදී.<br>කාර්ය සාධන තරඟ විනිශ්චය කටයුතු සැප්තැම්බර් තුන්වන සතියේ සිට ආරම්භ කිරීමටත් එමෙන්ම කාර්ය සාධන තරඟාවලියේ ජයග්‍රහකයින් සඳහා සහතික පත්‍ර ප්‍රධානොත්සවය 2023 දෙසැම්බර් මස තුන්වන සතියේදී පැවැත්වීමට අපේක්ෂා කරන බවද ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු ආණ්ඩුකාර ලේකම්<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

02

වාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ඉදිරිපත් කිරීමක් මඟින් සමස්ථ ප්‍රතිපාදන යොදවා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රගතිය සාකච්ඡා කරන ලදී.

ඒ අනුව ,

| | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත මුදල රු. මිලියන | දැනට වැයකර ඇති මුදල රු. මිලියන |
|---|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශය | 249 | 770 | 216 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 968 | 2683 | 916 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 784 | 2195 | 750 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 457 | 899 | 281 |
| ප්‍රවාහන අමාත්‍යාංශය | 433 | 902 | |

ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් සඳහන් කරන ලදී.

එක් එක් අමාත්‍යාංශ වලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විමසන ලද අතර ඒ අනුව පළාත් පාලන අමාත්‍යාංශයේ ව්‍යාපෘති 2023.09.30 දින වන විටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති 2023.10.31 දින වන විටත් අවසන් කිරීමට බලාපොරොත්තු වන බව එම අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සඳහන් කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරන ව්‍යාපෘති ඉදිරි මාස දෙක ඇතුලත නිම කිරීමට කටුයුතු කරන ලෙස දන්වන ලද අතර , කෘෂිකර්ම අමාත්‍යාංශයේ දැනට ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් විස්තර කරන ලදී.සියලුම අමාත්‍යාංශ වල ව්‍යාපෘති ඔක්තෝම්බර් මස වන විට නිම කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වලින් ඉදිරිපත් වූ යෝජනා අනුව ව්‍යාපෘති 7683 ක් සඳහා රු.මිලියන 18688 ක මුදලක් ඉල්ලුම් කර ඇත .එවැනි මුදලක් වෙන් කිරීමේ හැකියාවක් නොමැති බැවින් , අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡා කර එක් එක් අමාත්‍යාංශ වලින් මුදල් වෙන් කර ඒ සඳහා උපරිම රුපියල් මිලියන 4500 ක් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට අනුව එකඟ වූ බවත් , මෙම මුදල් වෙන් කරන ලද ව්‍යාපෘති ඵලදායී ව්‍යාපෘතිද යන්න හා පළාත් සභා විෂය පථයට අයත් වන්නේද යන්න පිළිබඳ අමාත්‍යාංශ ලේකම් වරුන් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර දැනුවත් වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| | | තවද සියලුම අමාත්‍යංශ ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සමඟ 2024 අය වැය සම්බන්ධව පවත්වනු ලබන සාකච්ඡාවේදී අය වැයට අදාළ යෝජනා ඉදිරිපත් කර අය වැයට පෙර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | |
| 03 | පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සම්බන්ධව | කාර්ය මණ්ඩල වල පවතින පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරිම රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ මේ වන විට නතර කර ඇති බවට ප්‍රධාන ලේකම් විසින් සඳහන් කරන ලදී.<br>අත්‍යාවශ්‍ය තනතුරු පමණක් පවත්වාගෙන යාමටත් පවත්නා අනිකුත් තනතුරු යටපත් කිරීමටත් ජනාධිපතිතුමා විසින් පියවර ගනිමින් සිටින බැවින් ප්‍රධාන අමාත්‍යංශ යටතේ ස්ථාපිත ඇතැම් දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතනවල අත්‍යාවශ්‍ය භාවය පිළිබඳ සමාලෝචනය සිදු කිරීම සඳහා කමිටුවක් පත් කිරීමටත් එම කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) මගින් සිදු කිරීමටත් ඒ අනුව පළාත් සභාව යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යමණ්ඩල අවශ්‍යතාවය සම්බන්ධයෙන් තීරණ ගැනිම සුදුසු බවද තීරණය විය. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 04 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ජාතික රක්ෂණ සංස්ථාවේ නිලධාරියෙකු කැඳවා මේ පිළිබඳ සාකච්ඡා කළ බවත් ඒ අනුව මෙම රක්ෂණාවරණය සඳහා ඇතුලත්වන නිලධාරීන් වෙනුවෙන් ලබා දෙන ප්‍රතිලාභ සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳවද සාකච්ඡා කළ බවත් , ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව පැහැදිලිව සඳහන්කර යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස එම නිලධාරියා දැනුවත් කළ බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ශ්‍රී ලංකා ජාතික රක්ෂණ සංස්ථාවෙන් එම යෝජනාව ඉදිරිපත් වූ පසු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සහා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් කුලී පදනම මත පවත්වාගෙන යන කාර්යාල පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ සභාපතීත්වයෙන් යුක්තව පත් කරන ලද කමිටුවේ ප්‍රගතිය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>එම වාර්තාව සකස්කර අවසන් කර ඇති බවත් ආපන ශාලාවේ VIP පරිශ්‍රයෙහි හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කර තිබූ පරිශ්‍රයෙහි ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ඉඩම් කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන අතර එම ආයතනයට ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම් ඉහළ මහලකින් ගබඩා පහසුකම් ලබා දිය හැකි බවද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද 9 වන මහලේ මේ වන විට රියදුරන් සඳහා වෙන් කර ඇති පරිශ්‍රයෙහි කාර්යාලයක් ස්ථාපිත කිරීමට සලකා බැලීමටත් රියදුරන් සඳහා එම මහලේම වෙනත් ඉඩකඩක් ලබා දීමට යෝජනා කරන බවත් සඳහන් කරන ලදී.<br>ඒ අනුව කොළඹ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය පළාත් සභා ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීමට ඇති හැකියාව සම්බන්ධව පළාත් පාලන අමාත්‍යංශ ලේකම් විසින් විමසා සිටි අතර ඒ සම්බන්ධව සලකා බැලීම සඳහා මෙම කමිටුව වෙත යොමු කිරීමට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 06 | ආණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරගාවලිය සම්බන්ධව | ආණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරඟාවලිය 2023.09.16 වන දින පැයක පමණ සමාරම්භක උත්සවයකින් අනතුරුව ක්‍රිකට් තරඟාවලියකින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රධාන ලේකම් විසින් සඳහන් කරන ලදී.<br>ඒ අනුව අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා බස්නාහිර පළාත් සභාවට අයත් සියලුම ආයතනවල නිලධාරීන් උනන්දුකර මේ සඳහා සහභාගී කර වීමට කටයුතු කරන ලෙසත් , පළාත් සභාවේ කිසිදු ප්‍රතිපාදනයක් මේ සඳහා යොදා ගැනීමක් නොකරන බැවින් ආහාර පාන ඇතුලු වෙනත් සියලුම අවශ්‍යතා තමන් විසින් සපයා ගැනීමට කටයුතු කරන මෙන්ද, සියලු ක්‍රීඩකයන් විනය ගරුකව ක්‍රීඩා සඳහා සහභාගී විය යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | රාජකාරි කටයුතු සඳහා දුරකතන ඇමතුම් වලට ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධව | දුරකතන වියදම් ලබා ගන්නා නිලධාරීන් රාජකාරී දුරකතන ඇමතුම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කර ඇති බවත් , ඒ අනුව යම් ප්‍රගතියක් දක්නට ලැබෙන නමුත් පළාත් සභා ගොඩනැගිල්ලෙන් පිටත ආයතනවල ඇතැම් නිලධාරීන් තව දුරටත් එසේ නොකරන බව දක්නට ලැබෙන බැවින් එම තත්ත්වය වලක්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ වගකීමක් බවත් අමාත්‍යාංශ ලේකම් වරුන් විසින් නිරන්තරයෙන්ම ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 08 | තලංගම රෝහල් පරිශ්‍රයේ සෞඛ්‍ය සේවා කාර්යාල පිහිටුවීම සම්බන්ධව | තලංගම රෝහල් පරිශ්‍රයෙහි ගොඩනගමින් පවතින නව ගොඩනැගිල්ලෙහි සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් කාර්යාල ස්ථාපිත කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය , කොළඹ දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා බත්තරමුල්ල සෞඛ්‍ය සේවා වෛද්‍ය නිලධාරී කාර්යාලය යන කාර්යාල ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බව සාකච්ඡා කරන ලදී.<br>තලංගම රෝහල් පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර 2024 වර්ෂයේ අය වැයෙන් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු නිම කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ සැලසුම් / ඉංජිනේරු) |
| 09 | බස්නාහිර පළාත් වෙබ් අඩවි තරඟාවලිය සම්බන්ධව | 2024 වර්ෂයේදී පැවැත්වීමට බලාපොරොත්තු වන වෙබ් අඩවි තරඟාවලිය සම්බන්ධව කරුණු සාකච්ඡා කරන ලදී.ඒ අනුව වෙබ් අඩවි තරඟාවලියට අදාළ ව්‍යාපෘති වාර්තාව තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මගින් ඉදිරිපත් කර ඇති බවත් ,එය ඇගයුම් කර නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත්කර ඇති අතර එමගින් ලැබෙන නිර්දේශ පදනම් කර ගනිමින් 2024 වර්ෂයට අදාළව එම තරගාවලිය පැවැත්වීමට කටයුතු සූදානම් කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>මෙම තරගාවලිය මගින් වෙබ් අඩවි වල ක්‍රියාකාරීත්වය වැඩි කිරීම අරමුණක් වන අතර සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් තම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන ප්‍රධානීන් ඒ පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 10 | කාර්මික නිලධාරීන්ගේ දීමනා වැඩි කිරීම සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉංජිනේරු අංශයේ සේවයේ නියුතු කාර්මික නිලධාරීන්ගේ සේවාව අනුව ඔවුන්ට ලබා දෙන දීමනාව වැඩිකර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>එවැනි දීමනාවක් ලබා දීම පිළිබඳ නිර්දේශයන් සමඟ එය ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් එය සුදුසු කමිටුවක් මඟින් හෝ වැඩි දුරටත් අධ්‍යනය කර නිර්දේශ ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11 | මාණ්ඩලික නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතනවල මාණ්ඩලික නිලධාරීන් සඳහා අබේපුස්ස පුහුණු මධ්‍යස්ථානයේදී වැඩ මුළුවක් පැවැත්වීමට සංවිධානය කරමින් පවතින බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>ගරු ආණ්ඩුකාරතුමාගේ සහභාගීත්වයෙන් ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර ලේකම් , සභා ලේකම් , පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ඇතුළුව අමාත්‍යාංශ ලේකම්වරුන් ,නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත ආයතන වල ප්‍රධාන විධායක නිලධාරීන් මෙම වැඩමුළුව සඳහා සහභාගී කරවීමට බලාපොරොත්තු වන බවද ඉදිරියේදී නිශ්චිත දිනයක් තීරණය කර දන්වන බවද ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සම්බන්ධව | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වීම සම්බන්ධව සාකච්ඡා කල අතර එම කමිටුවලට සහභාගී වීමෙදී ඇතැම් අවස්ථාවල ලේකම්වරුන් වෙනුවෙන් ආසන පහසුකම් හෝ නොමැතිවන අවස්ථා පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙනුවෙන් වෙනම ආසන වෙන්කර තබන ලෙස දිස්ත්‍රික්ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන බවත් අනිවාර්යයෙන්ම සියලු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් ඒ සඳහා සහභාගී වීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 13 | ප්‍රසම්පාදන අභියාචනා සඳහා මුදල් තැන්පත් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ ප්‍රසම්පාදන අභියාචනා සම්බන්ධව මුදල් තැන්පත් කිරීම පිළිබඳ ගැසට් නිවේදනය පල කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව ආණ්ඩුකාරතුමා විසින් ගැසට් නිවේදනය නිකුත් කිරීමට කටයුතු කර ඇති බව ප්‍රධාන නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br>ප්‍රසම්පාදන අභියාචනා සම්බන්ධව මුදල් තැන්පත් කර එහි පිටපත ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කල යුතු බවට සාකච්ඡා කරන ලදී.<br>ගැසට් නිවේදනය සම්බන්ධව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම ආණ්ඩුකාර ලේකම් විසින් සිදුකරන බව දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>ආණ්ඩුකාර ලේකම් |
| 14 | මූල්‍ය අංශයේ දැනුවත් කිරීම් | ➢ බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ කාර්යාලවල මාසික අතිකාල , ගමන් වියදම් , ආරක්ෂක , සනීපාරක්ෂක ආදි වියදම් සඳහා ගෙවීම් සිදු කිරීම මාස හයකට වරක් සිදු කරනු ලබන අතර 2024 අයවැය සාකච්ඡාවේදී එම කරුණ අවධාණයට යොමු වූ බවත් , ඒ සම්බන්ධව පැන නඟින ගැටළු පිළිබඳවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් සඳහන් කරන ලදී.<br>ඒ අනුව එම බිල් ගෙවීම මාස හයකට වරක් සිදු නොකර මාසිකව ගෙවීමට කටයුතු කිරීම කෙරෙහි අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අවධානයට යොමු කරන ලදී.<br><br>➢ බස්නාහිර පළාත් සභා සංකීර්ණයට අදාළ ජල බිල් හා විදුලි බිල් ගෙවීම ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර ප්‍රතිපාදන ලබා ගැනීමේදී පැවති මිල ගණන් මේ වන විට ඉහළ ගොස් ඇති බැවින් ජල හා විදුලි බිල් ගෙවීම සඳහා පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ ගැටළුවක් මතුව ඇත .එබැවින් එම බිල්පත් වෙනුවෙන් එක් එක් අමාත්‍යාංශ වලින් ඒ සඳහා දායකත්වයක් ලබා දීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) විසින් ඉල්ලා සිටින ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 15 | පළාත් පාලන ආයතනවල පවතින පරිපාලන නිලධාරී පුරප්පාඩු පිරවීම සම්බන්ධව | පළාත් පාලන ආයතනවල පරිපාලන නිලධාරී පුරප්පාඩු අටක් පවතින බවත් ,ඇතැම් පළාත් පාලන ආයතනවල පරිපාලන නිලධාරී පුරප්පාඩු සඳහා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් විසින් රාජකාරී ආවරණය සිදු කරන අතර පවතින රාජකාරී කටයුතු සමඟ එය සිදු කිරීමේ අපහසුතාවක් පවතින බැවින් පළාත් පාලන ආයතනවල පුරප්පාඩු සඳහා පරිපාලන නිලධාරීන් පත් කිරීමේ අවශ්‍යතාව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කරන ලදී.<br>පළාත් පාලන ආයතන සඳහා පරිපාලන නිලධාරීන් ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත